සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

09 ශ්‍රේණිය

# ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ ඉතා මනහර ලෙස ලෝකය මවා නිර්මාණය කළ බව සඳහන් පොත වන්නේ,
    (1) නික්මයාම ය. (2) උත්පත්ති ය. (3) ගණන් කථාව (4) ලෙවී කථාව
02. දාවිත් රජු තම පුත්‍රයා මෙන් සලකා රැකබලා ගත්තේ,
    (1) සලමොන් ය. (2) ජොනතන් ය. (3) මෙපිබොෂෙත් ය. (4) සාමුවෙල් ය.
03. දම්වැලක පුරුක් මෙන් ශුද්ධ බයිබලයේ අඛන්ඩව දිවෙන තේමාව වන්නේ,
    (1) කරුණාවයි. (2) ධර්මිෂ්ඨකමයි. (3) විශ්වාසයයි. (4) ප්‍රේමයයි.
04. කිතුණු ජීවිතයේ වැදගත්ම සන්නිවේදන මාධ්‍යය වන්නේ,
    (1) දේව වචනය. (2) සඟරා ය. (3) යාච්ඤාව ය. (4) දේශනාවය.
05. ජේසුස් වහන්සේ තම ප්‍රථම ප්‍රාතිහාර්ය කරනු ලැබුවේ,
    (1) කානාහිදී ය. (2) නාසරෙත්හි දී ය. (3) ගලීලයේ දී ය. (4) කපර්නවුමේදී ය.
06. ශුද්ධ ලියවිල්ලට අනුව සබත් දිනය ශුද්ධ ලෙස ගත කළ යුත්තේ ව්‍යවස්ථාවලියේ කීවෙනි පනතට අනුවද?
    (1) පළමු පනතට අනුවය. (2) දෙවන පනතට අනුවය.
    (3) තුන්වන පනතට අනුවය. (4) හතරවන පනතට අනුවය
07. කිතුණු සභාවට පීඩා කළද ක්‍රිස්තුස් වහන්සේ හමුවීමෙන් පසුව තම ජීවිතය වෙනස්කර ගත්තේ,
    (1) ස්තේපන්ය. (2) පේදුරුය. (3) සකෙවුස්ය. (4) සාවුල්ය.
08. A - විවාදය B - බීමත්කම C - පරාර්ථකාමීත්වය
    ඉහත වරණ අතුරින් මාංසික තෘෂ්ණා සඳහන් පිළිතුර වන්නේ,
    (1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) A, B හා C ය.
09. 'ප්‍රඥාව සමිඳුන්ගේ දීමනාවකි. .....” ලෙස සඳහන් වන්නේ,
    (1) ගීතාවලියේ ය. (2) හිතෝපදේශයේ ය.
    (3) කොරෙන්ති පොතෙහිය. (4) සලමොන්ගේ ප්‍රඥාවෙහිය.
10. සබත් දින සුවකරනු ලැබූ රෝගියා හා සුදර්ශන දොරටුව අසල සුවකරනු ලැබූ රෝගියා වූයේ,
    (1) මීමැස්පොර රෝගියා හා ලාදුරු රෝගියා ය.
    (2) අතක් පණනැති මිනිසා හා මීමැස්මොර රෝගියා ය.
    (3) අතක් පණ නැති මිනිසා හා කොර රෝගියා ය.
    (4) ලාදුරු රෝගියා හා කොර රෝගියා ය.

11. අප ක්‍රිස්තුස් වහන්සේ මෙන් තම කම බැහැර කළ යුත්තේ,

(1) අපගේ විමුක්තිය වෙනුවෙනි.

(2) අන් අයගේ විමුක්තිය වෙනුවෙනි.

(3) අපගේ හා අන් අයගේ විමුක්තිය වෙනුවෙනි.

(4) යහපත් මිනිසුන්ගේ විමුක්තිය වෙනුවෙනි.

12. වර්තමාන සමාජයෙන් පැමිණෙන නපුරු බලවේගයක් වන්නේ,

(1) පොදු සම්මතයට හිස නැමීමය.

(2) මත්ද්‍රව්‍ය, මත්කුඩු වලින් වැළකී සිටීමයි.

(3) නවීන සන්නිවේදන උපකරණ නිවැරදිව භාවිත කිරීමයි.

(4) ගුරු දෙගුරුන්ගේ උපදෙස් පිළිගැනීමට දක්වන මැලිකමයි.

13. ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය ලෙස සඳහන්ව ඇත්තේ,

(1) කොරින්ති පොතෙහි ය. (2) එපීස පොතෙහි ය.

(3) රෝම පොතෙහිය. (4) කොලොස්සි පොතෙහිය.

14. අපගේ ජීවිත ගැටළු හා අවශ්‍යතා වලදී කරදර නොවී දේව පුත්‍රයාණන් කෙරෙහි විශ්වාසයෙන් කටයුතු කළ යුතු බවට අවධාරනය කෙරෙන සිද්ධිය වන්නේ,

(1) රූප විපර්යාසය අවස්ථාවයි. (2) ගෝලයන් තෝරා ගන්නා අවස්ථාවයි.

(3) කානා නුවර සරණ මංගල්‍යයයි. (4) ක්‍රිස්තුස් වහන්සේගේ භෞතිස්ම ස්නාපනයයි.

15. පරම්පරාවේ නිදොස් මිනිසා ලෙස සැලකෙන්නේ,

(1) ආදම් ය. (2) නෝවා ය. (3) ආබ්‍රහම් ය. (4) ආබෙල් ය.

16. 'මා ඔබට නපුර කළ නමුත් ඔබ මට යහපත කලෙහිය.' ලෙස පැවසුවේ,

(1) සාවුල් දාවිත් ගැනය. (2) සාවුල් ජොනතන් ගැනය.

(3) දාවිත්, සාවුල් ගැනය. (4) දාවිත් මෙපිබොෂෙත් ගැනය.

17. බලාපොරොත්තුවෙහි........ වන්න. විපතේදී ................. වන්න. රෝම 12:12 පදයට අනුව හිස්තැනට උචිත වන්නේ,

(1) සතුටු හා ධෛර්යවත් ය. (2) ප්‍රීති හා ඉවසිලිවත් ය.

(3) ප්‍රීති හා ධෛර්යවත් ය. (4) සතුටු හා උත්සහවන්ත ය.

18. පාපය නමැති අඳුරෙන් අප ජීවිත ආලෝකමත් කර ගැනීමට අපට මඟ පෙන්වන්නේ,

(1) දෙමාපියන් ය. (2) ගුරුවරුන් ය. (3) දේව වචනය ය. (4) ජන මාධ්‍යය ය.

19. ක්‍රිස්තුස් වහන්සේ අපගේ වරදට කමා කරන්නේ,

(1) අප අන් අයගේ වරදට කමා කරන ආකාරයට ය.

(2) අන් අය අපගේ වරදට කමා කරන ආකාරයට ය.

(3) අප අන් අයට දන්දෙන ආකාරයට ය.

(4) අපගේ යාච්ඤාව අනුවය.

20. දේව වචනයට අනුව ජීවත් වන අප,

(1) සූදුව සම්පූර්ණයෙන් වැළඳ ගත යුතුය. (2) අයුතු කෙටිකාලීන ලාභ අපේක්ෂා නොකළ යුතුය.

(3) අයුක්තිය වෙනුවෙන් පෙනීසිටිය යුතුය. (4) මුදල් ඉපැයීම සඳහා අනියම් ක්‍රියා කළ යුතුය.

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- **කෙටි පිළිතුරු සපයන්න.**

01. (i) ජුදෙව් නොවන විජාතීන් වෙත සුභාරංචිය ගෙනයාමට ස්වාමීන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද සුවිශේෂි පුද්ගලයා කවුද?

(ii) අපගේ ඇතුළාන්ත දේව සබඳතාවය පළුදු වීමෙන් අපට අහිමිවන දේවල් දෙකක් ලියන්න.

(iii) ක්‍රිස්තුස් වහන්සේට අයත් වූවෙකු ලෙස තමකම නසමින් අන් අයවෙනුවෙන් තම ජීවිතය කැපකළාවූ පුද්ගලයෙක් නම් කරන්න.

(iv) විෂම වූ සමාජයක සිටින මනුෂ්‍යයා අධිතක්සේරුවෙන් සිටින අවස්ථාවන් සඳහා උදාහරණ දෙකක් ලියන්න.

(v) ශුද්ධ වූ පාවුල් තුමා විසින් ලියන ලද ලිපි දෙකක් සඳහන් කරන්න.

(vi) දෙවියන් වහන්සේ මිනිසා වෙත අනාවරණය වන ප්‍රබලතම මාර්ගය කුමක්ද?

(vii) කිතුණු සභාව වෙනුවෙන් පළමුවෙන් තම ජීවිතය පූජා කළ ප්‍රථම වේදසාක්ෂිකයා කවුද?

(viii) අන්‍යයන්ගේ ඇදහිල්ල නිසා සුවය ලැබූ දෙදෙනෙක් නම් කරන්න. (ල. 2x8=16)

02. (i) පේදුරුතුමන් විසින් මරණයෙන් නැගිටුවන ලද කාන්තාව කවුද? ඇය ජීවත් වූයේ කොහේද?

(ii) ස්තේපන් තුමාගේ ජීවිතය තුළ දක්නට ලැබෙන සුවිශේෂි ගුණාංග 03 ක් ලියන්න.

(iii) ශුද්ධාත්ම බලයෙන් පූර්ණව ක්‍රියාකාරී වූ ප්‍රේරිතයන්ගේ ජීවිත තුළින් අපේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ 06 ක් ලියන්න.

03. (i) ශුද්ධ බයිබලයේ ගීතාවලියේ 119:105 වන පදයේ දේව වචනය සම්බන්ධයෙන් සඳහන්ව ඇත්තේ කුමක්ද?

(ii) දේව වචනය මගින් ඔබේ ජීවිතයට ලැබෙන මගපෙන්වීම් 03 ක් ලියන්න.

(iii) දේව වචනය කියවීමට පෙර, කියවන්නට යන දේව වචනය තේරුම් ගන්නට මග පෙන්වීම ඉල්ලා කරන යාච්ඤාවක් ලියන්න.

04. (i) එදිනෙදා ජීවිතයේ දී අපට මුහුණ දීමට සිදුවන ව්‍යසන දෙකක් ලියන්න.

(ii) ජීවිත පීඩා හමුවේ දෙවියන් වහන්සේ අපට පිහිට වන ආකාර 03 ක් ලියන්න.

(iii) දෙවි පියාණන් කෙරෙහි විශ්වාසය තබා ගනිමින් ඔබගේ ජීවිතයේ පීඩාවන් ජයගත් ආකාරය කෙටියෙන් ලියන්න.

05. (i) එපීස ලිපියට අනුව කිතුණු අප යාච්ඤා කළ යුතු ආකාර දෙකක් ලියන්න.

(ii) සමාජය තුළ පවතින නපුරු බලවේග විවිධ ස්වරූපවලින් අපවෙත පැමිණේ. එවැනි අවස්ථා 03 ක් ලියන්න.

(iii) අධ්‍යාත්මික, සටනේදී කිතුණුවන් විසින් සන්නාහ සන්නද්ධ විය යුතු යුද්ධායුධ මොනවාද?

06. (i) කිතුණු ප්‍රතිපත්ති බෙදා වෙන්කළ හැකි ආකාර දෙක මොනවාද?

(ii) කිතුණු ප්‍රතිපත්ති මත පිහිටා ඔබට පීඩ කරන්නන් උදෙසා ඔබ ක්‍රියා කරන ආකාර 03 ක් ලියන්න.

(iii) කිතුණු දරුවෙකු ලෙස පාසල තුළ ජීවිතාදර්ශයෙන් ක්‍රියා කළ හැකි ආකාර 06 ක් ලියන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 4 ) | 04. ( 1 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 4 ) | 08. ( 1 ) | 09. ( 2 ) | 10. ( 3 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 1 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 1 ) | 17. ( 2 ) | 18. ( 3 ) | 19. ( 1 ) | 20. ( 2 ) |

## II කොටස

(ල. 2x20=40)

01. (i) ශු. පාවුල් තුමා
(ii) ආත්මික ජීවිතය හා සදාකාලික ජීවිතය
(iii) ජේම්ස් එච් ඩැරල් දේවගැතිතුමා
(iv) ♦ තමා සතු ධනය ♦ තම බලය ♦ තම හැකියාව ♦ තම බුද්ධිය ♦ තමන් දරණ තනතුර
(v) එපීස ලිපිය, රෝම ලිපිය.
(vi) දේව වචනය
(vii) ස්තේපන්තුමා
(viii) දොර්කස් (තබීතා), රාජ්‍ය නිළධාරියාගේ පුත්‍රයා (ල. 2 x 8 = 161)

02. (i) දෝර්තස් (තබීතා), ජොප්පාවේ
(ii) ♦ නිර්භීතව දේශනා කිරීම. ♦ පීඩා දරා ගැනීම. ♦ පීඩා කරන්නන්ට සමාව දීම. ♦ නිර්භීතව මරණයට මුහුණ දීම. ♦ යාච්ඤාව තුළින් තම ආත්මය දෙවියන්ට භාර දීම.
(iii) ♦ ජීවමාන ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරීම. ♦ යාච්ඤාවෙන් සවිමත් වීම. ♦ හැමවිටම දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමටත් සාක්ෂි දැරීමටත් සූදානම්ව සිටීම. ♦ තමන්ට ඇති හැකියාවන් තුළින් අන් අයගේ ජීවිත ශක්තිමත් කිරීම. ♦ සමාජයේ අසරණව සිටින අයට උපකාර කිරීම. ♦ ශුද්ධාත්මයාණන්ගේ බලය කෙරෙහි විශ්වාස කිරීම. (සුදුසු පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.) (ල. 2+3+6 =11)

03. (i) ගීතාවලියේ 119:105, ඔබේ වචන මාගේ දෙපයට පහනක් ය. මාගේ මාවතට එළියක් ය.
(ii) ♦ දේව වචනය අප නිවැරදි මාර්ගයේ ගෙන යයි. ♦ අපව ධෛර්යමත් කරයි. ♦ සතුරන් (නපුර) පරාජය කරයි. ♦ අපගේ ජීවිත වලට සතුට ප්‍රීතිය ගෙන දෙයි.
(iii) මාතෘකාවට අදාළව යාච්ඤාව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 2+3+6 =11)

04. (i) නියගය, රිය අනතුරු, යුධ ගැටුම්, සුළිකුණාටු, මාරාන්තික රෝග පීඩා.
(ii) ♦ අපගේ සරණ හා ශක්තිය දෙවියන් වහන්සේ ♦ අපගේ ජීවිත සුරකින දෙවියන් වහන්සේ ♦ අඳුර මැද අපගේ බිය දුරුකරන දෙවියන් වහන්සේ ♦ ජයග්‍රහනය කරා අප මෙහෙයවන දෙවියන් වහන්සේ
(iii) ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 2+3+6 =11)

05. (i) ♦ මුළු සිතින්ම යාච්ඤා කිරීම. ♦ අවදිව නොකඩවා යාච්ඤා කිරීම. ♦ ශුද්ධාත්ම බලය කෙරෙහි විශ්වාසය තබමින් යාච්ඤා කිරීම.
(ii) ♦ මිතුරන් මගින් පැමිණෙන වැරදි පෙළඹවීම්. ♦ නවීන සන්නිවේදන උපකරණ වැරදි ලෙස භාවිතය. ♦ මත්ද්‍රව්‍ය, දුම්වැටි වැනිදේට පෙළඹවීම. ♦ ගුරු දෙගුරුන්ගේ උපදෙස් පිළිපැදීමට දක්වන මැලිබව.
(iii) ♦ සත්‍ය නමැති - ඉඟපටිය ♦ දැමිටුකම නමැති - ළයවැස්ම ♦ සාම සුබ අස්න නමැති - වහන් ♦ ඇදහිල්ල නමැති - පලිහ ♦ ගැළවීම නමැති - හිස්වැස්ම ♦ ශුද්ධාත්මයාණන්ගෙන් වන වචනය නමැති - නඩුව (ල. 2+3+6 =11)

06. (i) ♦ යහපත් දේව සබඳතාවක් වෙනුවෙන් පවත්වාගත යුතු ප්‍රතිපත්ති ♦ යහපත් සමාජ සම්බන්ධතාවක් වෙනුවෙන් පවත්වා ගත යුතු ප්‍රතිපත්ති.
(ii) ♦ පීඩා කරන්නන්ට ශාප නොකර ආශිර්වාද කිරීම. ♦ සතුරන් සමග වුවද සමාදානයෙන් ජීවත් වීම. ♦ සතුරන්ට සමාව දීම. ♦ අපට සතුරුකම් කරන්නන්ට සමාව දීම හෝ නොදීම දෙවියන් වහන්සේට අයත් කාරණයක් බව පිළිගැනීම.
(iii) ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල. 2+3+6 =11)